රුහුණ විශ්වවිද්‍යාලය

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

**2021/2022 අධ්‍යයන වර්ෂය - ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය**

**පළමු සමාසික අවසාන පරීක්ෂණය - 2023 මාර්තු**

**MAE 5103 - ශ්‍රී ලංකාවේ ආර්ථිකය**

එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින් තෝරාගෙන **ප්‍රශ්න හතරකට (04) පමණක්** පිළිතුරු සපයන්න.

කාලය : පැය තුනයි

---

**පළමු කොටස**

(01)

(i) "ජාත්‍යන්තර සහය ලබා ගැනීමේ අපේක්ෂාව සහ නව කාර්මික රටවල පැවති ප්‍රබල ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකාව තුළ වෙළෙඳ ලිහිල්කරණයක් සඳහා අවශ්‍ය පදනම සපයන්නට විය". 1977 න් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික හැසිරීම පිළිබඳ අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය ආර්ථික විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් යුතුව විචාරාත්මකව විමසන්න.

(ලකුණු 07 යි)

(ii) "1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමග විදේශ ආයෝජන දිරිගැන්වීමේ අපේක්ෂාවෙන් යුතුව රජය විසින් අපනයනාභිමුඛ ක්‍රියාකාරකම් වර්ධනය කිරීම සඳහා අපනයන සැකසුම් කලාප ස්ථාපිත කිරීමත්, රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකරණය කිරීමත් සඳහා උත්සුක විය". පෞද්ගලිකරණය තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති කළ හැකි බලපෑම් මොනවාද? සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

(02)

(i) "රටක තිරසාර සංවර්ධනය හා යහපාලනය අතර සෘජු හා වක්‍ර සබඳතා පවතී". ශ්‍රී ලංකාව හා සම්බන්ධ උදාහරණ භාවිතා කරමින් මෙම අදහස පිළිබඳ සාකච්ඡා කරන්න.

(ලකුණු 07 යි)

(ii) "තිරසාර සංවර්ධන අභිමතාර්ථ යනු සියලුම රටවල් විසින් සමෘද්ධිමත්භාවය වර්ධනය කරන අතරම ගෝලීය යහපැවැත්ම තහවුරු කිරීමයි". ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන අභිමතාර්ථ අත්පත් කරගැනිමෙහිලා දක්වන ප්‍රගතිය පිළිබඳ අදාළ දත්ත ඉදිරිපත් කරමින් මෙම ප්‍රකාශය විචාරාත්මකව විමසන්න .

(ලකුණු 08 යි)

(03) පහත මාතෘකා අතරින් තුනක් (03) පිලිබඳ විස්තරාත්මක සටහන් ලියන්න

(i) යහපාලන මූලධර්ම

(ii) යහපාලනය මිණුම් කිරීම

(iii) ගෝලීයකරණය මෙහෙයවන බලවේග

(iv) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ මෑත කාලීන උපනති

(ලකුණු 15 යි)

## දෙවන කොටස

(04)

(i) "උග්‍ර අර්බුදකාරී ලෝක ආර්ථික සන්දර්භය තුළ කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය නන් අයුරින් වර්ධනය වී ඇත". මෙම අදහස සනාථ කිරීමට ප්‍රමාණවත් සාධක සපයන්න.

(ලකුණු 05 යි)

(ii) වර්තමාන ශ්‍රී ලංකා ආර්ථිකයේ පසුබෑසීමට සමාන්තරව සමස්ත කෘෂිකාර්මික අංශය ද විවිධාකාරයෙන් අර්බුදයකට ගමන් කර ඇතැයි යන අදහසට ඔබ එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

(iii) ශ්‍රී ලංකාවේ පරිවර්තනීය ආර්ථිකයක් ශක්තිමත් කිරීමට ආහාර සුරක්ෂිතතාවය ජාතික ආර්ථිකයේ අවශ්‍යතාවයක් ලෙස සලකා කටයුතු කළ යුත්තේ කෙසේදකෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

(05)

(i) විදේශ සංචිත හීනවීම, වෙළෙඳ ගිණුම පුළුල් වීම, සහ ගෙවුම් ශේෂ පිරිහීම සඳහා බලපාන ලද හේතු සාධක මොනවාද ?

(ලකුණු 07 යි)

(ii) පවත්නා ආර්ථික හා දේශපාලන අස්ථාවරත්වය ප්‍රමාණවත් විදේශීය ආයෝජන ආකර්ෂණය වළක්වාලීමට ක්‍රියාත්මක වන්නේ කෙසේද කෙසේද යන්න විමර්ශනය කරන්න.

(ලකුණු 08 යි)

(06)

(i) "මෑත දශක තුල ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රම හමුදා සහභාගිත්වය අනුපාතය සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පවතී" මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? පැහැදිලි කරන්න.

(ලකුණු 07 යි)

(ii) ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළ ආශ්‍රිතව හඳුනාගත් ප්‍රධාන ලක්ෂණ මොනවාද?

(ලකුණු 08 යි)

*****************